// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2064/51 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය ඇමති, මංගල සමරවීර වන මම, 85 වගන්තියේ පරමාර්ථ සඳහා සාදන ලද නියෝග. මෙම නියෝග 2018 අප්‍රේල් මස 01 වනදා සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. වාසික පුද්ගලයෙකු වෙත ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත සේවා ගාස්තුවක් ගෙවන අවස්ථාවකදී 85 වගන්තියේ (1) උප වගන්තියෙහි (අ) ඡේදයෙහි (V) උපඡේදයෙහි සඳහන් පරමාර්ථ සඳහා පහත සඳහන් සේවා නියම කරනු ලැබේ.

i. වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී, නීතිඥ, මෘදුකාංග සංවර්ධනය කරන්නන්, පර්යේෂකයින්, විද්‍යාර්ථීන් වැනි වෘත්තීන්හී, නිදහස් සේවා සපයන්නන් ලෙස සපයන ලද යම් සේවාවක් හෝ වෙනත් යම් ඒ හා සමාන සේවාවන්

ii. ගිවිසුමක් යටතේ හෝ එසේ ගිවිසුමක් නොමැතිව සලසන්නාවූ සේවාවන් වන ඉදිකිරීම් කටයුතු සම්බන්ධ යම් සේවාවන්, ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා, යම් ආකාරයක උපදේශන සේවා, උත්සව අවස්ථා සංවිධානය, කෑම බීම සංග්‍රහ කටයුතු, මෝස්තර නිර්මාණය, ඇඳුම් සැකසීම, සංචාරක මාර්ගෝපදේශ, විනෝදස්වාදය, නියෝජිත කාර්යයන් හෝ ඒ හා සමාන කටයුතු

iii. යම් කළමනාකරණ සේවාවක්

iv. නිදහස් සේවා සපයන්නකු ලෙස සලසන්නා වූ යම් ආකාරයක වෘත්තීය සේවා

2. වාසික තැනැත්තෙකු නිර්වාසික තැනැත්තෙකුට ගෙවීමක් කරන අවස්ථාවේදී පනතේ 85 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ පරමාර්ථ සඳහා නියම කරන ලද 2% ක බදු අනුප්‍රමාණය. -

04 - 837

1A - PG 3984 — 507 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*